# කොවිඩ් 19 පසුබිම තුළ සමාජ-ආර්ථික දර්ශකය

මූලික වාර්තාව

2021 ජූනි

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය - සෝෂල් ඉන්ඩිකේටර්

# පටුන


| | |
|---|---|
| හැඳින්වීම | i |
| ක්‍රමවේදය | ii |
| **කොවිඩ්-19 වසංගතය කළමනාකරණය කිරීම පිළිබඳ තෘප්තිමත්භාවය** | **01** |
| කොවිඩ්-19 පිටුදැකීම සම්බන්ධයෙන් ආයතනික මැදිහත්වීම | 02 |
| ජීවන වියදම සහ අත්‍යවශ්‍ය භාණ්ඩ | 03 |
| සෞඛ්‍යසේවා | 04 |
| අධ්‍යාපනය | 04 |
| රැකියා සුරක්ෂිතභාවය | 05 |
| වසංගතය පැතිරීම පාලනය කිරීම | 06 |
| පුද්ගලයන්ට සාධාරණ ලෙස සැලකීම | 07 |
| **තොරතුරු ලබා ගැනීමේ මූලාශ්‍ර** | **08** |
| රජය විසින් පනවා ඇති කොවිඩ්-19 නීති රීති පිළිබඳ දැනුවත් කිරීමේ මට්ටම් | 09 |
| තොරතුරු මූලාශ්‍ර | 09 |
| **ජීවනෝපාය කෙරෙහි බලපෑම** | **10** |
| නිවෙස් වල සාමාන්‍ය මූල්‍ය තත්වය | 11 |
| මූල්‍ය හිඟය හේතුවෙන් ඇති වූ ප්‍රතිවිපාක | 12 |
| වසංගතය හේතුවෙන් ආදායමට ඇති බලපෑම | 13 |
| ආදායම අඩුවීම හේතුවෙන් අනුගමනය කරන උපාය මාර්ග | 14-15 |
| **අධ්‍යාපනය කෙරෙහි බලපෑම** | **16** |
| මාර්ගගත ඉගෙනීම සඳහා ඇති ප්‍රවේශය | 17-18 |
| මාර්ගගත ඉගෙනීමේ ගුණාත්මකභාවය පිළිබඳ තෘප්තිය | 19 |
| **සමාජ සම්බන්ධතා කෙරෙහි බලපෑම** | **20** |
| මිතුරන්, ඥාතීන් සහ අසල්වාසීන් සමඟ සබඳතා පැවැත්වීම | 21 |
| සමාජ කටයුතු සඳහා සහභාගීත්වය | 22 |
| අන්තර් ප්‍රජා සම්බන්ධතා කෙරෙහි බලපෑම | 23-24-25 |
| **සෞඛ්‍යසේවා කෙරෙහි බලපෑම** | **26** |
| සෞඛ්‍යසේවා සඳහා ප්‍රවේශය | 27 |
| කොවිඩ් සඳහා වූ එන්නත පිළිබඳ මතය | 28 |

# හැඳින්වීම

කොරෝනා වෛරසය පැතිරීම මුලින්ම වාර්තා වූයේ වර්ෂ 2019 දෙසැම්බර් 31 දින චීනයේ හුබෙයි පළාතේ වුහාන් නගරයෙනි. වර්ෂ 2020 ජනවාරි 30 වන දින ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නව කොරෝනා වෛරසය ජාත්‍යන්තර වශයෙන් අවධානය යොමු කළ යුතු මහජන සෞඛ්‍ය පිළිබඳ හදිසි අවස්ථාවක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද අතර වර්ෂ 2020 මාර්තු මස 11 වන දින එය වසංගතයක් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදි. ශ්‍රී ලංකාව තුළ එම වෛරසය පිළිබඳ පළමු සිද්ධිය අනාවරණය වූයේ වර්ෂ 2020 ජනවාරි 27 වන දිනය. මේ අවස්ථාව වන විට තහවුරු වූ රෝගීන් 140,471 ක් සහ මරණ 941[1] ක් වාර්තා වී ඇති අතර, මෙම වසංගත තත්වය සමඟ පොරබදමින් සිටින ශ්‍රී ලංකාව, රට වසා දැමීම සහ දිවයින පුරා බලපැවැත්වෙන සංචරණ සීමා පැනවීම, විවිධ ග්‍රාම නිලධාරී වසම් හුදකලා කිරීම, පාසල් සහ ව්‍යාපාර කටයුතු සම්පූර්ණයෙන් වසා දැමීම, ආදී තත්වයන් හි ප්‍රතිඵලයක් වශයෙන් එය ශ්‍රී ලාංකිකයන්ගේ දෛනික ජීවිතයට බොහෝ ආකාරවලින් බලපා ඇත. මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වූයේ මෙවන් පසුබිමක මහජනයාගේ අදහස් ඇගයීමට ලක් කිරීම සහ මෙම වසංගතය ඔවුන්ගේ ජීවනෝපායන්, සෞඛ්‍ය, අධ්‍යාපනය සහ සමාජ සබඳතාවලට කොතරම් දුරට බලපා ඇත්ද යන්න සම්බන්ධයෙන් අවබෝධ කර ගැනීමයි. එමෙන්ම, පවතින වර්තමාන තත්ත්වය මගින් සමාජ ආර්ථික සාධක මත පදනම් වන අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් රජයට ඇති අවශ්‍යතාව තවදුරටත් අවධාරණයෙන් ඉස්මතු කර ඇති අතර එහිලා මේ සම්බන්ධයෙන් මහජනතාවගේ අදහස් අවබෝධ කර ගැනීම අතිශයින්ම වැදගත්ය.

පුද්ගලයන්ට සහ ප්‍රජා අන්තර් සබඳකම් සම්බන්ධයෙන් සාධාරණ ලෙස සැලකීම, කොවිඩ්-19 වසංගතය පිළිබඳ දැනුවත්භාවය සහ තොරතුරු මූලාශ්‍රයන්, මූල්‍යමය දුෂ්කරතා හේතුවෙන් උද්ගත තත්වයන් කළමනාකරණය උදෙසා භාවිතා වන උපාය මාර්ග, අධ්‍යාපනයට ඇති ප්‍රවේශය සහ සෞඛ්‍යසේවා සැපයීම ආදී ක්ෂේත්‍රයන්ට අදාළ ආයතනයන් මගින් කොවිඩ් අර්බුදය අවම කිරීම සම්බන්ධයෙන් කෙරෙන කටයුතු පිළිබඳ තෘප්තිමත්භාවය මෙම මූලික වාර්තාව මගින් ඉදිරිපත් කෙරේ.

මෙම අධ්‍යනය සිදුකළ සමීක්ෂණ කණ්ඩායම, ආචාර්ය ප්‍රදීප් පීරිස්, සකිනා මොයිනුඩීන් සහ එම්. ක්‍රිෂ්ණමූර්ති යන අයගෙන් සමන්විත විය.

මෙම සමීක්ෂණය සිදු කිරීමේ දී ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු සහ භවානි ෆොන්සේකා විසින් ලබාදුන් සහයෝගයට සහ මෙම කටයුත්ත සිදුකිරීම උදෙසා අරමුදල් ලබා දුන් සත්‍යය, යුක්තිය සහ ප්‍රතිසන්ධානය සඳහා වූ ගෝලීය වැඩසටහන [Global Initiative for Justice Truth and Reconciliation (GIJTR)] වෙත සෝෂල් ඉන්ඩිකේටර් ආයතනය ස්වකීය ස්තුතිය පුද කරනු ලැබේ.

[1] කොවිඩ්-19 සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙහි නිල වෙබ් අඩවිය, යොමුව COVID-19 Sri Lanka Update | Coronavirus Related News Sri Lanka (covid19.gov.lk)" වර්ෂ 2021 මැයි මස 16 වන දින ප්‍රවේශ විය

# ක්‍රමවේදය

දිවයිනේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි නාගරික හා ග්‍රාමීය ජනගහනය නියෝජනය වන ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හතරෙන් ප්‍රතිචාර දැක්වූවන් දහසක් (1000) සමඟ අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිත කරමින් මුහුණට මුහුණ සිදු කළ සම්මුඛ සාකච්ඡා ඔස්සේ දත්ත රැස් කරන ලදී. ජීවනෝපාය, සෞඛ්‍ය, අධ්‍යාපනය සහ සමාජ සම්බන්ධතා යන ක්ෂේත්‍රයන් කෙරෙහි වසංගතයේ බලපෑම සම්බන්ධයෙන් වන මහජන මතය ඇගයීම මෙම සමීක්ෂණයේ අරමුණ විය. මීට අදාළ ක්ෂේත්‍ර කටයුතු ආරම්භ කිරීමට පෙර අධ්‍යයනය, පර්යේෂණ මෙවලම සහ ක්ෂේත්‍ර ක්‍රමවේදයන් පිළිබඳව ක්ෂේත්‍ර සමීක්ෂකයන්ට පුළුල් පුහුණුවක් ලබා දෙන ලදී.

පූර්ව පරීක්ෂණයඃ

ප්‍රශ්නාවලියට අදාළ භාෂාවෙහි පැහැදිලිකම, ප්‍රශ්නවල අනුක්‍රමික බලපෑම සහ පිළිතුරු කාණ්ඩවල අදාළත්වය පරීක්ෂා කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් කණ්ඩායමක් විසින් පූර්ව පරීක්ෂණයක් පවත්වන ලදී. පූර්ව පරීක්ෂණය සඳහා ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් සමඟ හමුවක් වර්ෂ 2021 පෙබරවාරි 15 වන දින පවත්වන ලදී. සමීක්ෂණයට අදාළ නිල දත්ත රැස් කිරීමේ ක්ෂේත්‍ර කටයුතු ඇරඹීමට පෙර සිංහල හා දෙමළ භාෂා කතා කරන ප්‍රජාවන් නියෝජනය කරන ලද ප්‍රතිචාරකයන් අතර මෙකී පූර්ව පරීක්ෂණය වර්ෂ 2021 පෙබරවාරි 16 සහ 17 යන දිනවල සිදු කෙරුණි. එකී පූර්ව පරීක්ෂණ අධ්‍යයනයේ සොයාගැනීම් මත පදනම්ව ප්‍රශ්නාවලියෙහි ගුණාත්මකභාවය තවදුරටත් වැඩි දියුණු කරන ලදී.

ප්‍රධාන සමීක්ෂණයඃ


ප්‍රධාන අධ්‍යයනය සඳහා වූ ක්ෂේත්‍ර පුහුණු හමුව වර්ෂ 2021 පෙබරවාරි 27 සහ 28 යන දෙදින තුළ පැවැත් විය. මෙම අධ්‍යයනයට පිරිමි සහ ගැහැණු යන දෙඅංශයේම ක්ෂේත්‍ර සමීක්ෂකයන් 71 ක් දෙනෙක් සහභාගී විය. සම්මුඛ පරීක්ෂණ පැවැත්වූයේ ප්‍රතිචාරකගේ සහ ක්ෂේත්‍ර සමීක්ෂකගේ මවු භාෂාවෙන් ය. එක්රැස් කරන ලද දත්තවල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා, ක්ෂේත්‍ර දත්ත රැස් කිරීම් අතරතුර දී සහ ඉන් පසුව සමීක්ෂක සමග ක්ෂේත්‍රයෙහි චාරිකා කිරීම සහ පසු නිරීක්ෂණ කටයුතු සිදු කරන ලදී. මෙහි දත්ත සමාජ විද්‍යාවන් සඳහා භාවිතා වන සංඛ්‍යාන පැකේජය (Statistical Package for Social Sciences - SPSS) භාවිත කරමින් විශ්ලේෂණය කර ඇත.

මෙම සමීක්ෂණයට අදාල දත්ත එක්රැස් කිරීමේ ක්ෂේත්‍ර කටයුතු වර්ෂ 2021 පෙබරවාරි මස 27 වන දින සිට මාර්තු මස 24 වන දින දක්වා සිදු කෙරුණි.

# ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වසංගතය කළමනාකරණය කිරීම පිළිබඳ තෘප්තිමත්භාවය

# කොවිඩ්-19 පිටුදැකීම සම්බන්ධයෙන් ආයතනික මැදිහත්වීම

මෙරට කොවිඩ්-19 වසංගත තත්වය පිටුදැකීම සම්බන්ධයෙන් අදාළ කටයුතු සිදු කරනු ලබන විවිධ ආයතන විසින් ගන්නා ලද උත්සහයන් කෙරෙහි තමන් කොතරම් තෘප්තිමත් ද යන්න සම්බන්ධයෙන් ප්‍රතිචාරකයන්ගෙන් විමසන ලදි. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ප්‍රකාශ කරනු ලබන්නේ තම ප්‍රදේශවල මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සහ ග්‍රාම නිලධාරීන්, පොලීසිය, හමුදාව සහ ජනාධිපතිවරයා පිළිබඳව තමන් තෘප්තිමත් බවයි. මෙහි දී ප්‍රතිචාරකයන් පෙනවා දෙන පරිදි අවම තෘප්තිමත්භාවයක් ඇත්තේ ස්වකීය ප්‍රදේශ නියෝජනය කරනු ලබන පාර්ලිමේන්තු නියෝජිතයන් සම්බන්ධයෙනි.




# ජීවන වියදම සහ අත්‍යවශ්‍ය භාණ්ඩ

කොවිඩ්-19 වසංගත තත්වය තුළ ජීවන වියදම සහ අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල කළමනාකරණය කිරීමේදී රජයේ කාර්යසාධනය පිළිබඳව ඔවුන්ගේ තෘප්තිමත්භාවයෙහි මට්ටම ප්‍රතිචාරකයන්ගෙන් විමසන ලදි.


කොවිඩ්-19 වසංගතය තුළ ජීවන වියදම පිළිබඳ තත්වයට විසඳුම් ලබාදීමේ දී රජයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් (58.1%) අතෘප්තිමත් බව පෙන්වා දෙන ලද අතර ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 40.1% ක් ඒ සම්බන්ධයෙන් තෘප්තිමත් බව පෙන්වා දුනි. එසේ තෘප්තිමත් බවට අදහස් දැක්වූ ප්‍රතිචාරකයන් වාසය කරන ප්‍රදේශය සම්බන්ධයෙන් ගත් කල, ඔවුන්ගෙන් වැඩි පිරිසක් බොහෝ දුරට ග්‍රාමීය ප්‍රජාවන් නියෝජනය කරන අය වූ අතර එකී මතයෙහි සිටි නාගරික ප්‍රජාව සාපේක්ෂව අඩු බවක් පෙන්නුම් කෙරුණි. නාගරික හා ග්‍රාමීය ප්‍රජාවන්ගෙන් බහුතරයක් රජයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ස්වකීය අතෘප්තිය පෙන්නුම් කළද, එකී මතය දරන්නන්ගෙන් සුළු වශයෙන් වැඩි පිරිසක් නියෝජනය කරන ලද්දේ නාගරික ප්‍රජාවෙනි.

**කොවිඩ් 19 කාලය තුළදී ජීවන වියදම සම්බන්ධයෙන් රජයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ඔබ කොතරම් දුරට තෘප්තිමත්ද ?**




අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පාලනය කිරීම සම්බන්ධයෙන් රජයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් (66.4%) ප්‍රකාශ කරන ලද්දේ තමන් ඒ පිළිබඳව අතෘප්තිමත් බවයි. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් තුනෙන් එකක් පමණ තෘප්තිමත් බව කියා සිටිති. ඒ සම්බන්ධයෙන් තමන් තෘප්තිමත් යන අදහස දැරූ ප්‍රතිචාරකයන් වාසය කරන ප්‍රදේශය සලකා බලන කල, ඔවුන්ගෙන් වැඩි පිරිසක් ග්‍රාමීය (35.1%) ප්‍රදේශයන් නියෝජනය කරනු ලබන අතර, එම මතය දරන නාගරික ප්‍රජාව (25.4%) ඊට සාපේක්ෂව අඩු ප්‍රමාණයකි. මෙම තත්වය සම්බනධයෙන් අතෘප්තිමත් යැයි ප්‍රකාශ කරන ලද බහුතරයෙන්, ග්‍රාමීය (64.3%) ප්‍රජාවට සාපේක්ෂව නාගරික (73.2%) ප්‍රජාවෙහි අතර තරමක් ඉහළ ප්‍රතිශතයක් පෙන්නුම් කෙරුණි.


**රජය විසින් අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල පාලනය කළමනාකරණය**



# සෞඛ්‍යසේවා

සෞඛ්‍යසේවා සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සැලකිය යුතු බහුතරයක් (80% කට ආසන්න ප්‍රතිශතයක්) පෙන්නුම් කරනු ලබන්නේ ඔවුන් ඒ සම්බන්ධයෙන් තෘප්තිමත් වන අතර 21.3% ක් ඒ පිළිබඳ ස්වකීය අතෘප්තිමත්භාවය පෙන්නුම් කරනු ලබයි. මේ සම්බන්ධයෙන් තෘප්තිමත් බව ප්‍රකාශ කරන ලද බොහෝ ප්‍රතිචාරකයන් පිරිසක් ග්‍රාමීය ප්‍රජාව (81.1%) නියෝජනය කරනු ලබයි.


**කොවිඩ් 19 කාලය තුළ රජය විසින් සෞඛ්‍ය සේවා කළමනාකරණය**




# අධ්‍යාපනය

කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ පාසල් අධ්‍යාපන කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රජයේ ක්‍රියාකලාපය කෙරෙහි ජනතා මතය එකිනෙක සමාන තලයක බෙදුනු ස්වභාවයක් පෙන්නුම් කරන අතර එහිදී සුළු බහුතරයක් (50.5%) ඒ සම්බන්ධයෙන් තෘප්තිමත්භාවයට පත්වන බවත්, ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 46% කට ආසන්න ප්‍රමාණයක් ඒ පිළිබඳ රජයේ කාර්යසාධනය සම්බන්ධයෙන් අතෘප්තිමත් බවත් ප්‍රකාශ කර සිටිති. මෙම වසංගත කාල සීමාව තුළ පාසල් අධ්‍යාපනය කළමනාකරණය කිරීම පිළිබඳව රජය ක්‍රියා කළ ආකාරය සම්බන්ධයෙන් ජනතා තෘප්තිමත්භාවයෙහි රටාව සලකා බලන කල, ප්‍රතිචාර දැක්වූ නාගරික හා ග්‍රාමීය ප්‍රජාවන්ගෙන් එක හා සමාන ප්‍රමාණයක් තෘප්තිමත් සහ අතෘප්තිමත් යන ස්ථාවරයන් පෙන්වා දී ඇති බව පැහැදිලි වේ.


**කොවිඩ් 19 කාලය තුළ රජය විසින් පාසල් දරුවන්ගේ අධ්‍යාපනය කළමනාකරණය**



# රැකියා සුරක්ෂිතභාවය

කොවිඩ්-19 වසංගතය තුළ රැකියා සුරක්ෂිතතාව සහතික කිරීම සම්බන්ධයෙන් වන රජයෙහි කළමනාකරණ වැඩපිළිවෙල සම්බන්ධයෙන්, ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් (52.7%) අතෘප්තිමත් බව පෙන්වාදෙන ලද අතර 40% ක් පමණ ප්‍රතිචාරකයන් ඒ සම්බන්ධයෙන් රජයේ උත්සාහයන් ගැන තෘප්තිමත් වන බව ප්‍රකාශ කරති. මෙලෙස අදහස් දැක්වූ ප්‍රතිචාරකයන් වාසය කරන ප්‍රදේශ සම්බන්ධයෙන් ගත් කල, තෘප්තිමත් බව ප්‍රකාශ කර සිටින අයගෙන් බහුතරයක් ග්‍රාමීය ප්‍රජාව නියෝජනය කරනු ලබන අතර, අතෘප්තිමත් බව පෙන්වා දෙන පිරිස බොහෝ දුරට නාගරික ප්‍රජාව නියෝජනය කරනු ලබන ප්‍රතිචාරකයින් ය.


**කොවිඩ් 19 කාලය තුළ රජය විසින් රැකියා සුරක්ෂිතභාවය / රැකියා අවස්ථා ආරක්ෂා කිරීම කළමනාකරණය**




# වසංගතය පැතිරීම පාලනය කිරීම

කොවිඩ්-19 වසංගතය පැතිරීම පාලනය කිරීම සඳහා රජයේ කාර්යසාධනය පිළිබඳව ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් තෘප්තිමත් වන බව පැහැදිලිව පෙන්නුම් කෙරුණි. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් තුනෙන් එකක් පමණ ඒ සම්බන්ධයෙන් අතෘප්තිමත් බව ප්‍රකාශ කරති. ඒ සම්බන්ධයෙන් තෘප්තිමත් වන බව ප්‍රකාශ කර සිටින ප්‍රතිචාරකයන්ගෙන්, බොහෝ දුරට එම මතය දරනු ලබන්නේ ග්‍රාමීය ප්‍රජාවන් නියෝජනය කරන පුද්ගලයන්ය. අතෘප්තිමත් බවට ප්‍රකාශ කරනු ලබන ප්‍රතිචාරකයන්ගෙන් බහුතරයක් නාගරික ප්‍රජාවට අයත් වේ.

**රජය විසින් කොවිඩ් 19 පැතිරීම පාලනය කළමනාකරණය**




# පුද්ගලයන්ට සාධාරණ ලෙස සැලකීම

වසංගතය කාලය තුළ පුද්ගලයන්ට සාධාරණ ලෙස සැලකීම සම්බන්ධයෙන් ගත් කල, රජය විසින් වසංගතය තත්වයට අදාළ නීති රීති සහ මාර්ගෝපදේශයන් ක්‍රියාත්මක කිරීමේ දී සමාජය තුළ පවත්නා විවිධ ආදායම් මට්ටම් වලට අදාළ ප්‍රජාවන් සහ ජනවාර්ගික කොටස් වලට සාධාරණ අන්දමින් එකී කටයුතු සිදුකර තිබේද යන්න පිළිබඳ ප්‍රතිචාරකයන්ගේ මතය විමසා බලන ලදි.


විවිධ ආදායම් කාණ්ඩවල පුද්ගලයින්ට සැලකීමේදී, ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 46% කට ආසන්න ප්‍රතිචාරකයන්ගේ මතය වූයේ රජය විසින් ක්‍රියාත්මක කරන ලද නීතිරීති සහ මාර්ගෝපදේශ සියලු ආදායම් කණ්ඩායම් සඳහා සාධාරණ බවය. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 40% ක් පමණ මෙම මතයට ප්‍රතිවිරුද්ධ අදහසක් ප්‍රකාශ කරනු ලබයි. සමාජයේ සියලුම ආදායම් ස්ථරයන්හි පුද්ගල කණ්ඩායම් සම්බන්ධයෙන් වූ නීති රීති සාධාරණ ලෙස ක්‍රියාත්මක වූ බවට ග්‍රාමීය ප්‍රජාව අතර බොහෝ දෙනා විශ්වාස කළද නාගරික ප්‍රජාවන්ගෙන් බහුතරයක් එකී මතයට ප්‍රතිවිරුද්ධ අදහසක් දරයි.


**ඔබගේ මතයට අනුව විවිධ ආදායම් මට්ටම් වලට අයත් කණ්ඩායම් අතර රජයේ කොවිඩ් 19 නීති (මාර්ගෝපදේශ) සාධාරණව ක්‍රියාත්මක වේද?**



විවිධ ජනවාර්ගික කණ්ඩායම්වල අයත් පුද්ගලයන්ට සැලකීමේ තත්වය සලකා බලන විට, සමාජයේ සියලුම ජනවාර්ගික කණ්ඩායම් සඳහා නීතිරීති සහ මාර්ගෝපදේශ සාධාරණ ලෙස ක්‍රියාත්මක කර ඇති බව ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 47% කට ආසන්න ප්‍රමාණයක් පිළිගෙන ඇති අතර ප්‍රතිචාර දැක්වූවන්ගෙ න් 37% ක් පමණ ඊට ප්‍රතිවිරුද්ධ මතයක සිටී. ජනවාර්ගික දෘෂ්ටි කෝණයකින් ගත් කල; සමාජයේ සියලුම ජනවාර්ගික කණ්ඩායම් සම්බන්ධයෙන් නීති රීති සහ මාර්ගෝපදේශයන් අසාධාරණ ලෙස ක්‍රියාත්මක වූ බවට වන මතය බොහෝ දුරට දරනු ලබන්නේ මුස්ලිම් ප්‍රජාව (54%) ය. දෙමළ සහ උඩරට දෙමළ ප්‍රජාවන්ගෙන් බහුතරයක්, සිංහල ප්‍රජාව හා සමානම ස්ථාවරයක් දරන අතර, කොවිඩ්-19 නීති සහ මාර්ගෝපදේශ රජය විසින් සාධාරණ ලෙස ක්‍රියාත්මක කළ බව ඔවුන්ගේ මතය වේ.

**සියලු ජනවාර්ගික කණ්ඩායම් වලට අයත් ජනකොටස් අතර රජයේ කොවිඩ් 19 නීති (මාර්ගෝපදේශ) සාධාරණව ක්‍රියාත්මක වේද?**




සාධාරණයි
අසාධාරණයි
නොදන

# තොරතුරු ලබා ගැනීමේ මූලාශ්‍ර


# රජය විසින් පනවා ඇති කොවිඩ්-19 නීති රීති පිළිබඳ දැනුවත් කිරීමේ මට්ටම්

සම්මුඛ සාකච්ඡාවට භාජනය වූ සියලුම ප්‍රතිචාර දැක්වූවන් පාහේ පෙන්නුම් කරනු ලබන්නේ රජය විසින් පනවා ඇති කොවිඩ්-19 නීති රීති පිළිබඳව ඔවුන් දැනුවත් බවයි.




# තොරතුරු මූලාශ්‍ර

ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් (80.1%) මාධ්‍ය (රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත්) හරහා කොවිඩ්-19 නීති රීති පිළිබඳ තොරතුරු ලබා ගන්නා බව පෙනේ. ඊට අමතරව, ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 13.2% ක් සමාජ මාධ්‍ය හරහා තමන්ට තොරතුරු ලැබෙන බව ප්‍රකාශ කරනු ලබයි.




# ජීවනෝපාය කෙරෙහි බලපෑම

# නිවෙස් වල සාමාන්‍ය මූල්‍ය තත්ත්වය

ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් (67.8%) පෙන්නුම් කරනු ලබන්නේ කොවිඩ්-19 ආරම්භයට පෙර පැවති තත්ත්වයට සාපේක්ෂව ඔවුන්ගේ ගෘහස්ථ මූල්‍ය තත්ත්වය නරක අතට හැරී ඇති බවයි. නාගරික ප්‍රජාවට සාපේක්ෂව ග්‍රාමීය ප්‍රජාවෙන් ප්‍රතිචාර දැක්වූවන්ගෙන් තරමක් ඉහළ ප්‍රතිශතයක් මේ හා සමාන මතයක් දරන බව ප්‍රකාශ කරනු ලබයි.


**කොවිඩ් 19 ආරම්භ වීමට පෙර පැවැති ඔබගේ නිවසේ මූල්‍ය තත්ත්වය හා සන්සන්දන කරන විට, ඔබගේ නිවසේ වර්තමාන මූල්‍ය තත්ත්වය කෙසේද?**




# මූල්‍ය හිඟය හේතුවෙන් ඇති වූ ප්‍රතිවිපාක

මෙම වසංගත තත්වය හේතුවෙන්, නිවාස කුලී ගෙවීම්, උකස් වාරික හෝ කල්බදු (ලීසිං) ගෙවීම් ප්‍රමාද වීම, මිලදී ගත් ආහාරවල ගුණාත්මකභාවය අඩු කිරීම, ගන්නා කෑම වල ප්‍රමාණය අඩු කිරීම සහ දිනකට ගන්නා ආහාර වේල් ප්‍රමාණය අඩු කිරීම ආදී වශයෙන් වූ ප්‍රතිවිපාකයන් ගණනාවකට මුහුණ දීමට සිදුවී ඇති බව ප්‍රතිචාර දැක්වූවන් පෙන්වා දෙයි.

**කොවිඩ් 19 ආරම්භයේ සිට ඔබ හෝ ඔබේ නිවසේ සිටින අයෙකුට මුදල් හිඟකම හේතුවෙන් පහත සඳහන් කිසිවක් කිරීමට සිදු වුයේද?**









ඔව්

# වසංගතය හේතුවෙන් ආදායමට ඇති බලපෑම

ආදායමට ඇති බලපෑම සම්බන්ධයෙන් සලකා බලන කල, ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් (60% කට ආසන්න සංඛ්‍යාවක්) වසංගත තත්වය හේතුවෙන් ඔවුන්ගේ නිවසේ ආදායම අඩු වී ඇති බව පෙන්නුම් කරනු ලබයි. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් ආසන්න වශයෙන් 10% ක් ප්‍රකාශ කර සිටින්නේ ඔවුන්ට තම නිවාසයන්හි ආදායම සම්පූර්ණයෙන්ම අහිමි වී ඇති බවයි. එම මතය දරන ප්‍රතිචාරකයන්ගෙන් 11.3% නාගරික ප්‍රජාවද 9% ක් ග්‍රාමීය ප්‍රජාවද නියෝජනය කරනු ලබයි.

**කොවිඩ් 19 ආරම්භ වීමට පෙර කාලය හා සන්සන්දනය කිරීමේ දී ඔබගේ නිවසේ ආදායම පිළිබඳ සිතීමේදී නිවසේ ආදායම කොතරම් දුරට වැඩි වී හෝ අඩු වී ඇත්දැයි කිව හැකිද?**









- වැඩි වී ඇත
- වෙනසක් නොමැත
- අඩු වී ඇත
- සම්පූර්ණයෙන්ම නිවසේ ආදායම අහිමි වී ඇත
- නොදනී

# ආදායම අඩුවීම හේතුවෙන් අනුගමනය කරන උපාය මාර්ග

තමන්ගේ නිවාසයෙහි ආදායම නැතිවීම හෝ අඩුවීම හේතුවෙන් අදාළ ප්‍රතිචාරකයන් විසින් අනුගමනය කිරීමට පෙළඹී ඇති විවිධාකාරයේ උපාය මාර්ග තෝරා ගැනීමට ඉඩ ප්‍රස්ථාව ලබා දුනි. එකී උපාය මාර්ග ලැයිස්තුව වූ කලී රජයේ ආධාර, වෙනත් අයගෙන් ලැබුණු සහය (මිතුරන්, ඥාතීන්, හිතවතුන් ආදිය), ණය දෙන්නන්ගෙන් හෝ වෙනත් අයගෙන් ණයට මුදල් ගැනීම, උකස් කළ ස්වර්ණාභරණ / බැංකුවලින් ලබාගත් ණය, ණයට භාණ්ඩ මිලදී ගැනීම, ඉතිරිකිරීම් භාවිතා කිරීම, සමහර වියදම් අඩු කිරීම, ආදායම් උත්පාදනය සඳහා විකල්ප ආදායම් මාර්ග සොයා ගැනීම සහ වටිනා දේපළ විකිණීම ආදී වශයෙන් වූ පරාසයක කරුණු ආවරණය කරන්නක් විය.





නාගරික
ග්‍රාමීය
රජයේ ආධාර
49.6%
29.8%
18.3%
2.3%
34.8%
21.8%
31.4%
11.8%
වෙනත් අයගෙන් ලැබුණ සහය (යහලුවන්/ඥාතීන්/ හිතවතුන්)
55.7%
9.9%
29.0%
4.6%
52.9%
8.1%
31.9%
6.9%
ණයට දෙන්නන්ගෙන් හෝ වෙනත් අයගෙන් ණයට මුදල් ගැනීම
65.2%
10.6%
21.2%
3.0%
60.5%
8.3%
20.3%
10.7%
රතුං බඩු උකස් කිරීම හෝ බැංකුවලින් ණය ලබා ගැනීම
59.8%
9.1%
22.7%
8.3%
46.8%
7.5%
27.8%
17.5%
ණයට භාණ්ඩ මිලදී ගැනීම
62.1%
6.8%
21.2%
9.8%
49.3%
5.4%
30.8%
14.3%
ඉතිරිකිරීම් භාවිතා කිරීම
38.2%
3.1%
33.6%
24.4%
32.3%
5.1%
33.1%
28.2%
සමහර වියදම් අඩු කිරීම
17.3%
5.3%
38.3%
39.1%
9.2%
1.9%
38.4%
49.7%
ආදායම් උත්පාදනය සඳහා වෙනත් ආදායම් මාර්ගයක් සොයා ගැනීම
78.8%
1.5%
12.9%
6.8%
64.6%
5.3%
19.8%
7.2%
වටිනා භාණ්ඩ හෝ දේපළ විකිණීම
91.6%
6.1%
0.8%
0.8%
88.0%
5.6%
3.4%
0.9%
බොහෝ විට
සමහර විට
එක් වරක්
කිසිවිටෙකත් නැත

# අධ්‍යාපනය කෙරෙහි බලපෑම

# මාර්ගගත/ඔන්ලයින් ඉගෙනීම සඳහා ඇති ප්‍රවේශය

වසංගත තත්වය තුළ මාර්ගගත (ඔන්ලයින්) ඉගෙනීම සඳහා ප්‍රවේශ වීමේ හැකියාව සලකා බැලීමේ දී, ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයකට ඒ සඳහා ප්‍රමාණවත් තරම් ඉලෙක්ට්‍රොනික උපකරණ නොමැති බව කියා සිටින අතර ඒ හේතුවෙන් තිබෙන එවන් උපකරණ පවුලේ සාමාජිකයන් සමග බෙදා ගැනීම, යමෙකුගෙන් හෝ වෙනත් ස්ථානයකින් ණයට ගැනීම හෝ වසංගත කාලය අතරතුර මාර්ගගත ඉගෙනුම් ලබා ගැනීමේ ක්‍රියාවලියෙන් ඉවත්ව ඔන්ලයින් ඉගෙනීම සම්පූර්ණයෙන්ම නතර කිරීමට සිදු වීම ආදී වශයෙන් වූ තත්වයක් පෙන්නුම් කෙරුණි.


**මෙම නිවසේ ඔන්ලයින් ඉගෙනුම් ක්‍රමවේද අනුගමනය කරන්නන් සඳහා ප්‍රමාණවත් ඉලෙක්ට්‍රොනික උපකරණ (පරිගණක/ස්මාට් දුරකථන/ටැබ් ආදිය) තිබේද?**




- අපට ප්‍රමාණවත් ඉලෙක්ට්‍රොනික උපකරණ තිබේ
- ප්‍රමාණවත් නොවන නමුත් නිවසේ සිටින අනෙක් සාමාජිකයින් සමග බෙදා ගෙන භාවිතා කළ හැකිය
- ප්‍රමාණවත් නොවේ. අපට වෙනත් අයගෙන් හෝ වෙනත් තැනකින් ඉල්ලා ගැනීමට සිදු වේ
- කිසිම උපකරණයක් නොමැත. අපි ඔන්ලයින් ඉගෙනුම් ක්‍රියාවලියෙන් සම්පූර්ණයෙන්ම ඉවත් වී ඇත
- කිසිවෙකු ඔන්ලයින් ඉගෙනීම් කටයුතුවලට සම්බන්ධ වන්නේ නැත


ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් (43%) පෙන්නුම් කරනු ලබන්නේ ඔවුන්ට අන්තර්ජාලයට ප්‍රවේශය ඇති නමුත් එකී සම්බන්ධතාවය ඉතා දුර්වල බවයි. ප්‍රතිචාරකයන් ජීවත්වන ප්‍රදේශ වශයෙන් ගත් කල මේ සම්බන්ධයෙන් තත්ත්වයෙහි පැහැදිලි බෙදීමක් පෙන්නුම් කරන අතර නාගරික ප්‍රජාවෙහි සැලකිය යුතු බහුතරයක් සඳහා අන්තර්ජාල සම්බන්ධතාවයට ඉතා හොඳ ප්‍රවේශයක් ඇති බව පෙන්නුම් කරන විට - ග්‍රාමීය ප්‍රජාව අතර ඉතා ඉහළ ප්‍රතිශතයක් පෙන්නුම් කරනු ලබන්නේ ඉතා දුර්වල අන්තර්ජාල සම්බන්ධතාවයක් යටතේ ඔවුන්ට ඒ සඳහා ප්‍රවේශයක් ඇති බවයි.

**මෙම නිවසේ අන්තර්ජාල පහසුකම් වලට සම්බන්ධ වීමට හැකියාව පවතීද?**




අන්තර්ජාල සම්බන්ධතාවය සඳහා වන වියදම සම්බන්ධයෙන් ගත් කළ, ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් (61.3%) පෙන්නුම් කරනු ලබන්නේ ඔන්ලයින් ඉගෙනීම දිගටම කරගෙන යාම සඳහා අන්තර්ජාල සම්බන්ධතාවය (දත්ත) සඳහා වියදම් කිරීම ඔවුන්ට අපහසු බවයි. මෙම ගැටලුව ග්‍රාමීය ප්‍රජාව අතර සැලකිය යුතු මට්ටමක පවතින බව පැහැදිලිව පෙනේ.


**ඔන්ලයින් ඉගෙනීම් ක්‍රමය අඛණ්ඩව පවත්වා ගෙන යාමට අවශ්‍ය අන්තර්ජාල පහසුකම් (Data) වෙනුවෙන් වියදම් කිරීමට ඔබේ පවුලේ අයට කොතරම් දුරට මූල්‍යමය හැකියාවක් තිබේද?**



# මාර්ගගත/ඔන්ලයින් ඉගෙනීමේ ගුණාත්මකභාවය පිළිබඳ තෘප්තිය

මාර්ගගත/ඔන්ලයින් ඉගෙනීම තුළින් ලැබෙන අධ්‍යාපනයේ ගුණාත්මකභාවය පිළිබඳව ප්‍රතිචාරකයින්ට මිශ්‍ර මත ඇති බව පෙනේ. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 52.7% ක් සෑහීමකට පත්වන බව කියා සිටින අතර 41.8% ක් සෑහීමකට පත් නොවෙති.


**ඔන්ලයින් ඉගෙනුම තුළින් ලැබෙන අධ්‍යාපනයේ ගුණාත්මකභාවය පිළිබඳ තෘප්තිමත්භාවය**




# සමාජ සම්බන්ධතා කෙරෙහි බලපෑම


# මිතුරන්, ඥාතීන් සහ අසල්වාසීන් සමග සබඳතා පැවැත්වීම

කොවිඩ්-19 වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රතිචාර දැක්වූවන්ගේ මිතුරන්, ඥාතීන් සහ අසල්වාසීන් සමග සම්බන්ධතා පැවැත්වීමේ පැහැදිලි අඩුවීමක් දක්නට ලැබේ.




# සමාජ කටයුතු සඳහා සහභාගීත්වය



# අන්තර් ප්‍රජා සම්බන්ධතා කෙරෙහි බලපෑම


අඩු ආදායම්ලාභී ජනාවාස සම්බන්ධයෙන් පවතින මතයට අනුව, ප්‍රතිචාරකයන්ගෙන් බහුතරයකගේ (55.6%) අදහස වන්නේ අඩු ආදායම්ලාභී ජනාවාස අතර කොවිඩ්-19 බහුලව පැවතිය හැකි බවයි.

**සමහර ආගමික කණ්ඩායම්වල සංස්කෘතික / ආගමික පිළිවෙත් තුළින් කොවිඩ් 19 පැතිරීමේ හැකියාව වැඩි විය හැකිය**




ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සැලකිය යුතු බහුතරයක් (71.1%) විශ්වාස කරනු ලබන්නේ සමහර ආගමික කණ්ඩායම්වල සංස්කෘතික/ආගමික පිළිවෙත් කොවිඩ්-19 පැතිරීමේ වැඩි හැකියාවක් ඇතිවීම සඳහා හේතුවක් විය හැකි බවයි. මේ අදහස සමග එකග නොවන ප්‍රතිචාරකයන්ගෙන්, බොහෝ දුරට මෙම මතය දරන්නේ මුස්ලිම් ප්‍රජාවේ ප්‍රතිචාරකයින් ය.

**සමහර ආගමික කණ්ඩායම්වල සංස්කෘතික / ආගමික පිළිවෙත් තුලින් කොවිඩ් 19 පැතිරීමේ හැකියාව වැඩි විය හැකිය**



කොවිඩ්-19 හි ව්‍යාප්තිය අදහස් දැක්වූ ප්‍රතිචාරකයන්ගේ ජනවාර්ගික කණ්ඩායමෙහි ප්‍රජාව අතර අඩුවෙන් පවතී ද යන්න පිළිබඳ විමසූ කල්හි, ඔවුන් ඉදිරිපත් කළ අදහස් වල යම් විභේදනයක් පවතින බව පෙනේ.




# සෞඛ්‍යසේවා කෙරෙහි බලපෑම


# සෞඛ්‍යසේවා සඳහා ප්‍රවේශය

කොවිඩ්-19 අර්බුදය අතරතුර රෝහලකට/වෛද්‍යවරයකු හමුවීමට ගිය තැනැත්තන්ගෙන් 65.1% ක් පෙන්නුම් කරනු ලබන්නේ එය හදිසි වෛද්‍ය අවශ්‍යතාවක් සඳහා සිදු වූ බව වන අතර ප්‍රතිචාරකයන්ගෙන් 27% කට ආසන්න සංඛ්‍යාවක් පෙන්නුම් කරනු ලබන්නේ එසේ යන්නට සිදු වූයේ සාමාන්‍ය වෛද්‍ය අවශ්‍යතා සඳහා බවයි. සමස්තයක් වශයෙන්, පවතින කොවිඩ් අර්බුදය එසේ තිබුනද, ප්‍රතිචාරකයන් ප්‍රකාශ කර සිටින්නේ අවශ්‍ය වෛද්‍ය සේවාවන් තමන්ට පහසුවෙන් ලබා ගැනීමේ හැකියාව පැවති බවයි.

**ඔබ රෝහලකට ගියේ නම් / වෛද්‍යවරයෙකු හමු වුයේ නම්, ඒ කුමන අවශ්‍යතාවයකට ද?**





**ඔබ රෝහලට / වෛද්‍යවරයා වෙත ගියේ නම් අදාළ සේවාවන් රෝහලෙන් /වෛද්‍යවරයා වෙතින් ලබා ගැනීමට කොතරම් පහසු වූවාද?**



# කොවිඩ් සඳහා වූ එන්නත පිළිබඳ මතය

එන්නත ලබා ගැනීම සම්බන්ධයෙන් සලකා බලන විට, ප්‍රතිචාරකයන්ගෙන් 11.3% ක් පෙන්නුම් කරනු ලබන්නේ ඔවුන්ට කිසි විටෙකත් එන්නත නොලැබෙනු ඇති බව වන අතර 21.7% ක් පෙන්නුම් කරනු ලබන්නේ ඔවුන්ට එය ඉක්මනින් නොලැබෙනු ඇති බවත් නමුත් අනාගතයේදී එය සිදු වන බවත්ය. තවදුරටත් ප්‍රමාදයකින් තොරව එන්නත ලබා ගත හැකි වනු ඇති බවට විශ්වාසයෙන් පසුවන්නේ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් තුනෙන් එකක් පමණි. ප්‍රතිචාරකයන්ගෙන් 27.2% ක් පෙන්නුම් කරනු ලබන්නේ එකී එන්නත අනෙක් අයට බලපාන්නේ කෙසේද යන්න මත පදනම්ව ඔවුන් ලබා ගැනීම සිදු කරන බවයි.

**කොවිඩ් 19 එන්නත ලබා ගැනීමට ඔබට අවස්ථාව උදා වුයේ නම් ඒ පිළිබඳ ඔබගේ මතය වඩාත් හොඳින් පිළිබිඹු වන්නේ මින් කවරකින්ද?**




- කිසිදු පමාවකින් තොරව මම එය ලබාගන්නවා
- අන් අයට එය කෙසේ බලපාන්නේ දැයි විමසීමෙන් පසුව මම එය ලබාගන්නවා
- එය ඉක්මනින්ම ලබා නොගනු ඇත, අනාගතයේදී ලබා ගනීවි
- මම කිසි විටෙකත් එන්නත ලබා නොගනු ඇත
- නොදනී

GIJTR
Global Initiative for Justice, Truth & Reconciliation

යුක්තිය, සත්‍යය සහ ප්‍රතිසන්ධානය සඳහා වූ ගෝලීය වැඩසටහන (GIJTR) මඟින් ගෝලීය සංවිධාන නවයක නියෝජනයෙන් මනෝ-සමාජ සහයෝගයෙහි සිට අධිකරණ වෛද්‍ය විද්‍යාව සහ නීතිය පිළිබඳ ලේඛන දක්වා වූ පරාසයක විවිධ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුම ඇති උපදේශකයින්, ක්‍රියාකාරීන් සහ වෘත්තිකයන් ඒකරාශී කරනු ලබයි. යුක්තිසහගත හා සාමකාමී අනාගතයක් නිර්මාණය කිරීමේදී ඔවුන් සැම එක්ව ගැටුම්කාරී පසුබිම්හි වෙසෙන ප්‍රජාවන්ට උපකාර කරනු ලබයි.

CPA
Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

25 YEARS 1996 - 2021
CENTRE FOR POLICY ALTERNATIVES

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිට වනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවි දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

ලිපිනය: නො. 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව.
දුරකථන: +94 (11) 2081384-6
ෆැක්ස්: +94 (11) 2081388
වෙබ්: www.cpalanka.org

Marking Social Research Count

සෝෂල් ඉන්ඩිකේටර් යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි (CPA) සමීක්ෂණ පර්යේෂණ ඒකකය වන අතර එය වර්ෂ 1999 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කෙරුණි. එමගින් සමාජ හා දේශපාලන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථිර, වෘත්තීය සහ ස්වාධීන සමීක්ෂණ මධ්‍යස්ථානයක් සඳහා දීර්ඝ කාලීනව පැවති රික්තයක් පුරවා ඇත. මත විමසීම් හරහා අදහස් ප්‍රකාශ කිරීම ප්‍රජාතන්ත්‍රවාදය සවිබල ගැන්වීමේ මෙවලමක්ය යන දැඩි විශ්වාසයෙන් යුක්තව සෝෂල් ඉන්ඩිකේටර් ආරම්භයේ සිටම සමාජ-ආර්ථික හා දේශපාලන ගැටලු රාශියක් පිළිබඳව මත විමසීම් පවත්වනු ලබයි.

ලිපිනය: 160 ජී, පූර්වාරාම පාර, කිරුළපන, කොළඹ 5.
දුරකථන: +94 11 2826010
වෙබ්: http://cpalanka.org/survey-research/
විද්‍යුත් තැපැල: sakina@cpasocialindicator.org